(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 112.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

491/'16

1.

ගරු කනක හේරත් මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දින 100 වැඩසටහන යටතේ නිදහස් වයි-ෆයි කලාප ඇති කිරීමේ ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) මේ යටතේ ඇතිකළ නිදහස් වයි-ෆයි කලාප ප්‍රමාණය කොපමණද;

(iii) ඒ පිළිබඳව සෑහීමකට පත් වන්නේද;

(iv) ඒවා ක්‍රියාත්මක තත්ත්වයේ පවතීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ නිදහස් වයි-ෆයි කලාප පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iii) ඉදිරියේදී නිදහස් වයි-ෆයි කලාප ඇති කරන ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

583/'16

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008.01.09 දින සිට 2008.04.09 දින දක්වා පැවති ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාවේ ප්‍රායෝගික පරීක්ෂණයේ උත්තර පත්‍ර පරීක්ෂාව පැන්සල් භාවිතා කොට සිදුකර ඇති බවත්;

(ii) ලකුණු කිහිප වරක් මකා දමා වෙනස් කර ඇති බවත්;

(iii) මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය ඉල්ලා සිටි බවත්;

(iv) ඒ අනුව පරීක්ෂණයක් සිදුකළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පරීක්ෂණ වාර්තාව මෙතෙක් ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

(ii) එම පරීක්ෂණ වාර්තාව සකස් කළ නිලධාරියා කවුරුන්ද;

(iii) ඔහු මේ වනවිට සේවයෙන් ඉවත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අසාධාරණයට ලක් වූ නිලධාරීන්ට ලබාදෙන සහන කවරේද;

(ii) මෙම වංචාවට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

757/'16

3.

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල වවුනියාව දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

792/'16

4.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.10 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ආයෝජනය සඳහා පැමිණි විදේශ ව්‍යාපාරිකයන් සංඛ්‍යාව සහ ආයෝජිත මුළු මුදල ඇමරිකානු ඩොලර් කොපමණද;

(ii) ආයෝජකයාගේ රට, විදේශ ව්‍යාපාර ආයතනයේ නම, ලිපිනය සහ ආයෝජිත මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ එකී ආයෝජන ව්‍යාපෘති පිහිටා ඇති ප්‍රදේශ හා ආයෝජන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට ඒ ඒ ව්‍යාපෘතිවල සේවය කරන ශ්‍රී ලාංකික සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයෝජනයට ප්‍රථම අදාළ ආයෝජකයා ලබාදීමට එකඟ වූ රැකියා සංඛ්‍යාව සහ සැපයූ රැකියා සංඛ්‍යාව අතර පරස්පරයන් ඇති ව්‍යාපෘති කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සඳහා අදාළ පහසුකම් ලබාගෙන හෝ ගිවිසුම්වලට එළඹුනු නමුත්, මේ දක්වා සිය ව්‍යාපෘති ආරම්භ නොකළ ආයෝජකයන් සිටින්නේද;

(iv) එසේ නම්, අදාළ ආයෝජකයාට හෝ සමාගමට පිරිනමා ඇති පහසුකම් කවරේද;

(v) 2012, 2013 සහ 2014 යන වර්ෂවලදී ශ්‍රී ලංකාව තුළ මුළු විදේශ ආයෝජනය වෙන් වෙන් වශයෙන් ඇමරිකානු ඩොලර්වලින් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

801/'16

5.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව්, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කයන්හි සමෘද්ධි සහනාධාර ලබාගන්නා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන, සමෘද්ධි සහනාධාර ලබාගැනීම සඳහා සුදුසුකම් තිබෙන එහෙත්, සමෘද්ධි සහනාධාර නොලැබෙන ජනතාවට එය ලබාදීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

816/'16

6.

ගරු ප්‍රසන්න රණවීර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 මැයි මස කොළොන්නාව, කැලණිය, කඩුවෙල, හංවැල්ල සහ බියගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට බරපතල ලෙස බලපෑ ගංවතුර තත්ත්වයෙන් පීඩාවට පත් පුද්ගලයන්ට රජය විසින් ලබාදීමට පොරොන්දු වූ රු.10,000/-ක දීමනාව මේ වනවිට ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා මේ වනවිට වැයකර ඇති මුදල කොපමණද;

(iii) ආධාර ලබාදීම සඳහා යොදාගනු ලබන නිර්ණායක කවරේද;

(iv) ආධාර ලැබීම සඳහා සුදුසුකම් ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) කුලී, බදු හෝ තාවකාලික පදනම මත නිවාසවල පදිංචිව සිටි පුද්ගලයන්හට මෙම මූල්‍ය ආධාරය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගංවතුරෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය, ජපානය වැනි රටවල්වලින් ලබා දෙන බවට ප්‍රකාශයට පත්වූ මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර මේ වනවිට මෙරටට ලැබී තිබේද;

(ii) එසේ නම්, ලැබී ඇති මූල්‍ය ආධාර ප්‍රමාණය හා ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආධාර ජනතාව වෙත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ආධාර ලැබී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

817/'16

7.

ගරු විමලවීර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ හෝ තදාසන්න ප්‍රදේශවල විවිධ සේවාවන්හි යෙදවීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සෙබළුන් පිට පළාත්වලින් කැඳවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ කැඳවා විවිධ සේවාවන්හි යොදවන සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සෙබළුන්ගෙන් යම් පිරිසකට වැටුපට අතිරේකව යැපීම් දීමනාවක් ගෙවන බවත්;

(ii) එම සේවාවන්ට හා තත්ත්වයන්ට සමානව සේවයේ යොදවනු ලබන තවත් සෙබළුන් පිරිසකට එම දීමනාව නොගෙවන බවත්;

(iii) ඒ අනුව සමාන සේවාවන් හා සමාන තත්ත්වයන් යටතේ එකී සෙබළුන් පිරිසට වෙනස් ආකාරයට සැලකීම අසාධාරණ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එසේ අසාධාරණයට ලක්වන සෙබළුන්ට සාධාරණ යැපීම් දීමනාවක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

822/'16

8.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරියෙකු විශ්‍රාම ගැන්වීමේදී මණ්ඩලයෙන් ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(ii) ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන කවරේද;

(iii) අදාළ ලිපිලේඛන විධිමත්ව තිබියදීත්, ප්‍රතිලාභ ගෙවීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(iv) මණ්ඩලයෙන් ගෙවනු ලබන ප්‍රතිලාභ කවරේද යන්න වෙන් වෙන් වශයෙන් අදාළ නිලධාරියා වෙත දන්වා නොයවන්නේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සේවයේ සිටියදී සෑම ගෙවීමක්ම නිලධාරියාට දැන්වීම හා ගෙවීම් ලබා ගත් බවට නිලධාරියාගෙන් අත්සන් ලබා ගැනීම සිදු කරන්නේ නම්, විශ්‍රාම ගැන්වීමේදී එම පිළිවෙත අනුගමනය නොකරන්නේ මන්ද;

(ii) එසේ නම්, එය වරදක් බව පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

(iv) වර්ෂ 2012 සිට මේ දක්වා විශ්‍රාම ගන්වන ලද සියලුම නිලධාරින්ට අදාළ ගෙවීම් කර අවසන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

588/'16

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්පාර නගර සභා බලප්‍රදේශයේ, "ඉන්ද්‍රසාරපුර" ග්‍රාම නිලධාරී වසමේ, අම්පාර - උහන ප්‍රධාන මාර්ගයට මුහුණලා අම්පාර දිසාපති මැදුර අසල පිහිටි පි.පි.අම් 827 ඉඩම වර්ෂ 2001 - 2013 අතර කාලය තුළ දීර්ඝ කාලීන බදුකරයක්, ඔප්පුවක් හෝ වෙනත් ආකාරයේ කිසියම් දීමනා පත්‍රයක් මඟින් යම් පුද්ගලයෙකුට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයාගේ නම, ලිපිනය හා තනතුර කවරේද;

(iii) අද වනවිට ඔහු විසින් මෙම ඉඩම අන්සතු කර තිබේද;

(iv) එසේ නම්, ඒ කවරෙකුටද;

(v) යළිත් මෙම ඉඩම ඩී. එස්. සේනානායක ගුණානුස්මරණ සභාවට ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

758/'16

10\.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල පුත්තලම දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් (ETF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

680/'16

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ සූදුරු හා මාදුරු ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට සූදුරු හා මාදුරු ආනයනය කරන ප්‍රධාන රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ සූදුරු හා මාදුරු වගා කරන්නේද;

(ii) එසේ නම්, එය ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

(iii) සූදුරු හා මාදුරු වගා නොකරන්නේ නම්, ඒ මන්ද;

(iv) ශ්‍රී ලංකාව තුළ සූදුරු හා මාදුරු වගාව ව්‍යාප්ත කිරීමට රජය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

759/'16

12.

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල පුත්තලම දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.
අභාවප්‍රාප්ත ගරු ජී. එන්. මහසෙන් පැල්පොල මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.
අභාවප්‍රාප්ත ගරු එස්. එල්. ගුණසේකර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3.
අභාවප්‍රාප්ත ගරු කේ. එන්. චොක්සි මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
විසර්ජන පනත් කෙටුම්පත (2017) — දෙවැනි වර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.
ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.
වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.
බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.
ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් සඳහා වන වැටුප් සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව ප්‍රකාරව අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා මාසික වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු ය.

ඒ අනුව, අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් 2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා අදියර 05කින් ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

එක් එක් තනතුරට අදාළ සම්පූර්ණ වැටුප් පරිමාණයන් පහත පරිදි වේ. (උපලේඛන I)

| **සේවා කාණ්ඩය** | **වැටුප් කේතය** | **වැටුප් පරිමාණය (රු.)** |
|---|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරවරයා | JS 5 - 2016 | 145,000 - 5 x 7,250 - 181,250 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්/ අභියාචනාධිකරණයේ සභාපතිවරයා | JS 4 - 2016 | 135,000 - 5 x 6,750 - 168,750 |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | JS 3 - 2016 | 131,500 - 5 x 6,575 - 164,375 |

නව වැටුප් පරිමාණයන් එක් එක් අදියරයන් යටතේ ක්‍රියාත්මක කිරීමට අදාළ වැටුප් පරිවර්තන වගු උපලේඛන II ලෙසද, වැටුප් පරිමාණයන් ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් උපලේඛන III ලෙසද මේ සමඟ ඉදිරිපත් කරන අතර අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

උපලේඛන I

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා වැටුප් ව්‍යුහය 2016**

| | සේවා කාණ්ඩය | වැටුප් කේතය | ආරම්භක පියවර | අවුරුදු ගණන | පළමු පියවර | උපරිමය |
|---|---|---|---|---|---|---|
| 1 | අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් | JS. 3 - 2016 | 131,500 | 5 | 6,575 | 164,375 |
| 2 | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්/ අභියාචනාධිකරණයේ සභාපතිවරයා | JS. 4 - 2016 | 135,000 | 5 | 6,750 | 168,750 |
| 3 | අග්‍රවිනිශ්චයකාරවරයා | JS. 5 - 2016 | 145,000 | 5 | 7,250 | 181,250 |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

**වැටුප් පරිමාණයන්**

වැටුප් පරිමාණයන්හි එක් එක් තීරුව මඟින් දැක්වෙන තොරතුරු මෙසේය.

1 තීරුව - අවුරුදු ගණන

2 තීරුව - සේවා කාලය

3 තීරුව - ශ්‍රේණිය

4 තීරුව - පත්වීමේදී සහ උසස් වීම ලැබුවේ නම්, ලැබෙන වැටුප් තලය

| සේවා ගණය | | | අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්/ අභියාචනාධිකරණයේ සභාපතිවරයා | අග්‍රවිනිශ්චයකාරවරයා |
|---|---|---|---|---|---|
| වැටුප් කේත අංකය | | | JS. 3 - 2016 | JS. 4 - 2016 | JS. 5 - 2016 |
| 1 | 2 | 3 | 4 | 4 | 4 |
| | | | 6,575 | 6,750 | 7,250 |
| | | | 5 | 5 | 5 |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| 1 | | | 131,500 | 135,000 | 145,000 |
| 2 | | | 138,075 | 141,750 | 152,250 |
| 3 | | | 144,650 | 148,500 | 159,500 |
| 4 | | | 151,225 | 155,250 | 166,750 |
| 5 | | | 157,800 | 162,000 | 174,000 |
| 6 | | | 164,375 | 168,750 | 181,250 |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

## වැටුප් පරිවර්තන වගු

**JS. 3 – 2016** උපලේඛන II

| වැටුප් පියවර | 2015.12.31 දිනට | | 2016.01.01 දිනට | | 2017.01.01 දිනට | | 2018.01.01 දිනට | | 2019.01.01 දිනට | | 2020.01.01 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප (රු.) | දළ වැටුප (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) |
| 1 | 63,500 | 85,525 | 77,100 | 8,425 | 90,700 | - | 104,300 | - | 117,900 | - | 131,500 | - |
| 2 | 66,675 | 89,176 | 80,955 | 8,221 | 95,235 | - | 109,515 | - | 123,795 | - | 138,075 | - |
| 3 | 69,850 | 92,828 | 84,810 | 8,018 | 99,770 | - | 114,730 | - | 129,690 | - | 144,650 | - |
| 4 | 73,025 | 96,479 | 88,665 | 7,814 | 104,305 | - | 119,945 | - | 135,585 | - | 151,225 | - |
| 5 | 76,200 | 100,130 | 92,520 | 7,610 | 108,840 | - | 125,160 | - | 141,480 | - | 157,800 | - |
| 6 | 79,375 | 103,781 | 96,375 | 7,406 | 113,375 | - | 130,375 | - | 147,375 | - | 164,375 | - |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

| වැටුප් පියවර | 2015.12.31 දිනට | | 2016.01.01 දිනට | | 2017.01.01 දිනට | | 2018.01.01 දිනට | | 2019.01.01 දිනට | | 2020.01.01 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප (රු.) | දළ වැටුප (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) |
| 1 | 65,000 | 87,250 | 79,000 | 8,250 | 93,000 | - | 107,000 | - | 121,000 | - | 135,000 | - |
| 2 | 68,250 | 90,988 | 82,950 | 8,038 | 97,650 | - | 112,350 | - | 127,050 | - | 141,750 | - |
| 3 | 71,500 | 94,725 | 86,900 | 7,825 | 102,300 | - | 117,700 | - | 133,100 | - | 148,500 | - |
| 4 | 74,750 | 98,463 | 90,850 | 7,613 | 106,950 | - | 123,050 | - | 139,150 | - | 155,250 | - |
| 5 | 78,000 | 102,200 | 94,800 | 7,400 | 111,600 | - | 128,400 | - | 145,200 | - | 162,000 | - |
| 6 | 81,250 | 105,938 | 98,750 | 7,188 | 116,250 | - | 133,750 | - | 151,250 | - | 168,750 | - |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

**JS. 5 – 2016**

| වැටුප් පියවර | 2015.12.31 දිනට | | 2016.01.01 දිනට | | 2017.01.01 දිනට | | 2018.01.01 දිනට | | 2019.01.01 දිනට | | 2020.01.01 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප (රු.) | දළ වැටුප (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) | මූලික වැටුප (රු.) | ගැලපුම් දීමනාව (රු.) |
| 1 | 70,000 | 93,000 | 85,000 | 8,000 | 100,000 | - | 115,000 | - | 130,000 | - | 145,000 | - |
| 2 | 73,500 | 97,025 | 89,250 | 7,775 | 105,000 | - | 120,750 | - | 136,500 | - | 152,250 | - |
| 3 | 77,000 | 101,050 | 93,500 | 7,550 | 110,000 | - | 126,500 | - | 143,000 | - | 159,500 | - |
| 4 | 80,500 | 105,075 | 97,750 | 7,325 | 115,000 | - | 132,250 | - | 149,500 | - | 166,750 | - |
| 5 | 84,000 | 109,100 | 102,000 | 7,100 | 120,000 | - | 138,000 | - | 156,000 | - | 174,000 | - |
| 6 | 87,500 | 113,125 | 106,250 | 6,875 | 125,000 | - | 143,750 | - | 162,500 | - | 181,250 | - |

අ/ක

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

ඇමුණුම I

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**කළමනාකරණ සේවා චක්‍රලේඛ........................................ අනුව 2016.01.01 දිනට**

**වැටුප් පරිවර්තනය කිරීම**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2016.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 වර්ගීකරණය අනුව 2015.12.31 දිනට අදාළ

   (අ) සේවා ගණය :
   (ආ) වැටුප් කේතය :
   (ඇ) වැටුප් පරිමාණය :
   (ඈ) වැටුප් පියවර :
   (ඉ) වැටුප් තලය : රු.
   (ඊ) අවසාන වැටුප් වර්ධකය ලද දිනය :

2. කළමණාකරණ සේවා චක්‍රලේඛ....................... වර්ගීකරණය අනුව 2016.01.01 දිනට උපලේඛන I අනුව

   (අ) සේවා ගණය :
   (ආ) වැටුප් කේතය :
   (ඇ) වැටුප් පරිමාණය :
   (ඈ) වැටුප් පියවර :
   (ඉ) වැටුප් තලය : රු.

3. උපලේඛන II අනුව 2016.01.01 දින සිට ගෙවිය යුතු වැටුප

   (අ) මූලික වැටුප : රු.
   (ආ) වැටුපෙහි ගැලපුම් දීමනාව : රු.

4. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම II

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2017.01.01 දිනට**

**වැටුප් පරිවර්තනය කිරීම**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2017.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2016. 12. 31 දිනට අදාළ

| | | |
|---|---|---|
| (අ) | සේවා ගණය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඇ) | උපලේඛන I අනුව අනුරූපී වැටුප | : |
| (ඉ) | උපලේඛන II අනුව ලද වැටුප් පියවර | : |
| (ඊ) | උපලේඛන II අනුව ලද වැටුප් තලය | : රු. |
| (උ) | අවසාන වැටුප් වර්ධකය ලද දිනය | : |

2. උපලේඛන II අනුව 2017.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම III

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2018.01.01 දිනට**

**වැටුප් පරිවර්තනය කිරීම**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2018.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2017.12.31 දිනට අදාළ

| | | |
|---|---|---|
| (අ) | සේවා ගණය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඈ) | උපලේඛන I අනුව අනුරූපී වැටුප | : |
| (ඉ) | උපලේඛන II අනුව ලද වැටුප් පියවර | : |
| (ඊ) | උපලේඛන II අනුව ලද වැටුප් තලය | : රු. |
| (උ) | අවසාන වැටුප් වර්ධකය ලද දිනය | : |

2. උපලේඛන II අනුව 2018.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

**සකස් කළේ:** අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

**පරීක්ෂා කළේ:** අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම IV

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**කළමනාකරණ සේවා චක්‍රලේඛ........................................ අනුව 2019.01.01 දිනට**

**වැටුප් පරිවර්තනය කිරීම**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2019.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2018.12.31 දිනට අදාළ

| | | |
|---|---|---|
| (අ) | සේවා ගණය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඈ) | උපලේඛන I අනුව අනුරූපී වැටුප | : |
| (ඉ) | උපලේඛන II අනුව ලද වැටුප් පියවර | : |
| (ඊ) | උපලේඛන II අනුව ලද වැටුප් තලය | : රු. |
| (උ) | අවසාන වැටුප් වර්ධකය ලද දිනය | : |

2. උපලේඛන II අනුව 2019.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

**සකස් කළේ:** අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

**පරීක්ෂා කළේ:** අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

ඇමුණුම V

වැටුප් පරිවර්තන ආදර්ශ ලිපිය

මගේ අංකය:

දිනය:

නම:

තනතුර:

**කළමනාකරණ සේවා චක්‍රලේඛ......................................... අනුව 2020.01.01 දිනට**

**වැටුප් පරිවර්තනය කිරීම**

යථෝක්ත චක්‍රලේඛය පරිදි ඔබගේ වැටුප 2020.01.01 දිනට පහත සඳහන් පරිදි පරිවර්තනය කරනු ලැබේ.

1. කළමනාකරණ සේවා චක්‍රලේඛ..................... වර්ගීකරණය අනුව 2019.12.31 දිනට අදාළ

| | | |
|---|---|---|
| (අ) | සේවා ගණය | : |
| (ආ) | වැටුප් කේතය | : |
| (ඇ) | වැටුප් පරිමාණය | : |
| (ඈ) | උපලේඛන I අනුව අනුරූපී වැටුප | : |
| (ඉ) | උපලේඛන II අනුව ලද වැටුප් පියවර | : |
| (ඊ) | උපලේඛන II අනුව ලද වැටුප් තලය | : රු. |
| (උ) | අවසාන වැටුප් වර්ධකය ලද දිනය | : |

2. උපලේඛන II අනුව 2020.01.01 දින සිට ගෙවිය යුතු වැටුප: රු.

3. සාවද්‍ය වර්ගීකරණයකින් හෝ ගණනය කිරීමකින් හෝ වෙනත් වරදක් හේතුවෙන් හෝ වැඩිපුර ගෙවීමක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එම මුදල් ආපසු අයකිරීමට යටත් වන බවද දන්වමි.

සකස් කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

පරීක්ෂා කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................

අනුමත කළේ: අත්සන: ....................................
නම: ....................................
තනතුර: ....................................
දිනය: ....................................
නිල මුද්‍රාව: ....................................

පිටපත්: 1. ....................................
2. ....................................

උපලේඛන III

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් සඳහා වන වැටුප් ව්‍යුහය 2016**

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් සඳහා ක්‍රියාත්මක වන වැටුප් පරිමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන් 2016.01.01 දින සිට අදියර 05කින් උපලේඛන II හි සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

**02. නව වැටුප් ව්‍යුහය තුළ පහත සඳහන් දීමනා අන්තර්ගත කර ඇත.**

(i) 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2011 සහ 2012.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 අනුව ගෙවනු ලබන විශ්‍රාම වැටුපට හිමිකම් රහිත විශේෂ දීමනාව.

(ii) 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014, 2014.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014(1) සහ 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2015 අනුව මාසිකව ගෙවනු ලබන රු.10,000 ක් වන අන්තර් දීමනාව.

**03. වැටුප් පරිවර්තනය**

03.1 දැනට පවතින වැටුප් පරිමාණයන්හි සිට නව වැටුප් පරිමාණයන්ට වැටුප් පරිවර්තනය කිරීම පියවරට පියවර තැබීමේ ක්‍රමය යටතේ සිදු කළ යුතුය. එහෙත් මෙම වැටුප් සංශෝධනය අදියර 05ක් යටතේ සිදු කරන බැවින් උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව අනුව වැටුප් පරිවර්තනය කළ යුතුය.

03.2 වැටුප් පරිවර්තන සැකසීමේ පහසුව සඳහා උපලේඛන I හි සඳහන් සෑම වැටුප් පරිමාණයක් සඳහාම වෙන් වෙන් වශයෙන් පරිවර්තන වගු උපලේඛන II හි දක්වා ඇත.

03.3 වැටුප් පරිවර්තනය කිරීමේ දී 2015.12.31 දිනට පවත්නා වැටුප් ව්‍යුහය යටතේ අදාළ වන වැටුප් කේතය පළමුව හඳුනා ගත යුතුය. ඒ අනුව මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් අනුරූපී වැටුප් කේතය සහ ඊට අදාළ උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව තෝරාගත යුතු ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි සඳහන් වැටුප් කේතයන්ට අනුරූපී මෙම චක්‍රලේඛය යටතේ වන නව වැටුප් කේතයන් පහත පරිදි වේ.

| **රා. ප. ච. 06/2006 අනුව වැටුප් කේතය** | **නව වැටුප් කේතය** |
|---|---|
| SF. 4 - 2006 | JS. 5 - 2016 |
| SF. 2 - 2006 | JS. 4 - 2016 |
| SF. 1 - 2006 | JS. 3 - 2016 |

03.4 නියමිත පරිවර්තන වගුව අනුව 2015.12.31 දිනට අදාළ වූ වැටුප් පියවරට අනුරූපී 2016.01.01 දිනට නියමිත වැටුප් පියවර අනුව අදාළ වන වැටුප් තලයෙහි පිහිටුවිය යුතුය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම I වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘතිය උපයෝගී කර ගත යුතුය.

03.5 ඉහත 03.4 හි අනුගමනය කළ ක්‍රමවේදය අනුවම 2017.01.01, 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 යන දිනයන්හි දී එළඹෙන වැටුප් පරිවර්තනයන් ද සිදුකළ යුතුය. මේ සඳහා උපලේඛන IIහි එක් එක් වර්ෂය යටතේ සඳහන් කර ඇති වැටුප් තලයන් අදාළ කරගත යුතුය. මෙම පරිවර්තනය සඳහා එක් එක් වර්ෂය වෙනුවෙන් ඇමුණුම II, III, IV සහ V වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘති උපයෝගී කර ගත යුතුය.

## 04. වැටුප් වර්ධකය ගණනය කිරීම

04.1 වැටුප් පරිමාණය තුළ වැටුප් වර්ධක ගණනය කිරීම

2016.01.01 දින සිට 2016.12.31 දක්වා වූ කාලය තුළ වැටුප් වර්ධකය උපයා ගන්නා අවස්ථාවේ දී ඉහත 03.4 හි පිහිටුවන ලද වැටුප් තලයට ආසන්න ඉහළ වැටුප් තලයේ පිහිටුවිය යුතුය. ඒ අනුව 2016 වර්ෂයට නියමිත වැටුප් වර්ධකයේ වටිනාකම ලෙස සැලකිය යුත්තේ අදාළ වැටුප් තලයන් දෙක අතර වෙනස වේ.

04.2 වැටුප් පරිමාණයේ උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ලබාදීම.

(අ) වැටුප් පරිමාණයක උපරිමයට පැමිණ ඇති විට 2016.01.01 දින සිට අදාළ විය යුතු වැටුප් තලය තීරණය කිරීම සඳහා උපලේඛන II හි අදාළ වැටුප් පරිවර්තන වගුවෙහි නියමිත තීරුවෙහි වැටුප් පරිමාණයේ අවසානයට ඇති වැටුප් තල දෙක අතර වෙනස වැටුප් වර්ධකය ලෙස සලකා වැටුප් පියවර ගණනය කළ යුතුය.

(ආ) 2016.01.01 දිනෙන් පසුව වැටුප් පරිමාණයක උපරිමය ඉක්මවා වැටුප් වර්ධක උපයාගන්නා අවස්ථාවක දී ද ඉහත (අ) හි පරිදි අදාළ වැටුප් පියවර ගණනය කළ යුතුය.

## 05. දළ වැටුපෙහි ගැලපුම් දීමනාව

05.1 මූලික වැටුපට අමතරව ඉහත 02 ඡේදයෙහි සඳහන් දීමනා සමඟ 2015.12.31 දිනට ලද දළ වැටුප සහ මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් එක් එක් වර්ෂයට අදාළ මූලික වැටුප අතර වෙනස දළ වැටුපෙහි ගැලපුම් දීමනාවක් ලෙස ගණනය කොට එහි ඇතුළත් කර ඇත. ඒ අනුව එක් එක් වර්ෂය සඳහා නියමිත මූලික වැටුපට අමතරව ඊට අනුරූපී ගැලපුම් දීමනාව ද ගෙවිය යුතුය. මෙම ගැලපුම් දීමනාව මෙහි පහත 16 හි සඳහන් කාර්යය හැර වෙනත් කිසිදු කාර්යයක් සඳහා වැටුපෙහි කොටසක් වශයෙන් නොසැලකිය යුතුය.

05.2 ඉහත 04.2 හි පරිදි උපරිමයෙන් ඔබ්බට වැටුප් පියවර ගණනය කළ අවස්ථාවකදී එම පියවරට අදාළ දළ වැටුපෙහි ගැලපුම් දීමනාව ද ගෙවිය යුතුය. මේ සඳහා පළමුව 2015.12.31 දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හෝ ඊට සංශෝධන වශයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ යටතේ ලැබූ වැටුප් තලය හා මෙම චක්‍රලේඛයේ දෙවන ඡේදයේ සඳහන් චක්‍රලේඛ යටතේ හිමි දීමනාවන් පමණක් ඇතුළත් දළ වැටුප ගණනය කළ යුතුය. එම වැටුප හා ඉහත 04.2 යටතේ ගණනය කරන ලද වැටුප් තලය අතර මූල්‍යමය අවාසියක් වන්නේ නම්, එම අගය දළ වැටුපෙහි ගැලපුම් දීමනාවක් වශයෙන් නියමිත වැටුප් තලය සමඟ ගෙවිය යුතුය.

**06.** **උසස්වීමක දී වැටුප් පරිවර්තනය කිරීම.**

මෙම අදියර ක්‍රමය යටතේ වැටුප් පරිවර්තනය සිදු කරනු ලබන කාල සීමාව තුළ (2016.01.01 සිට 2020.01.01 දක්වා) උසස්වීම් ලබන අවස්ථාවකදී එම උසස්වීම්වලට අදාළ වැටුප් පරිවර්තනයන්හිදී අදාළ කර ගත යුත්තේ උපලේඛන II හි සඳහන් එම උසස්වීම ක්‍රියාත්මක වන වර්ෂයට අදාළ තීරුවෙහි දැක්වෙන වැටුප් තලයන් වේ.

**07.** **අනෙකුත් දීමනා**

07.1 මෙම චක්‍රලේඛයේ දෙවන ඡේදයෙහි සඳහන් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් ලබා දී ඇති දීමනා අන්තර්ගත කරමින් නව වැටුප් ව්‍යුහය සකස් කර ඇති බැවින් 2016.01.01 දින සිට එම දීමනා ගෙවීම නතර කළ යුතුය.

07.2 අංක 37/2013 හා 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ගෙවනු ලබන මසකට රු.7800 ක් වන ජීවන වියදම් දීමනාව තවදුරටත් ගෙවිය යුතුය.

**08.** **විශ්‍රාම වැටුප්**

08.1 මෙම චක්‍රලේඛයේ වැටුප් ව්‍යුහය මත 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන්නන් සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී අදාළ කරගත යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි අවසානවරට ලද වැටුප් පියවර විය යුතුය.

08.2 උපලේඛන I හි සඳහන් වැටුප් පරිමාණයන් 2020.01.01 දින සිට සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවීමත් සමඟම 2016.01.01 දින සේවයේ සිට ඉන්පසුව විශ්‍රාම ලැබූවන්ගේ විශ්‍රාම වැටුප ද ඒ අනුව සංශෝධනය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ. 2016.01.01 දින සිට 2019.12.31 දක්වා අතර කාලය තුළ දී විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදු කරනු නොලැබේ.

08.3 අංක 05/2015 දරන 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු.3500 ක් වන අන්තර් දීමනාව මෙම චක්‍රලේඛය යටතේ 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගනු ලබන්නන් සඳහා නොගෙවිය යුතුය. එහෙත් අංක 37/2013 සහ 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු.3525 ක් වන ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය.

**09.** **වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා**

වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා 2015.12.31 දිනට පැවති මූල්‍යමය අගයට සීමා කළ යුතුය. 2016.01.01 දිනට පසු මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වන තනතුරකට පත්කරනු ලබන විටක මෙම දීමනාව ගණනය කිරීම සඳහා එම තනතුරට 2015.12.31 දිනට හිමිව තිබූ වැටුප පදනම් කරගත යුතුය.

**10. පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීම**

මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන 2020.01.01 දින දක්වා සිදු කරනු ලබන බඳවාගැනීම් / උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය අදාළ කරගත යුතුය. එහෙත් ගෙවීම් සිදුකළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි විය යුතු බැවින් ඒ බැව් ද එම පත්වීම් ලිපිවල සඳහන් කළ යුතුය.

**11. තනතුරු / සේවා වර්ගීකරණය**

අධිකරණ නිලධාරීන් 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන III හි තනතුරු වර්ගීකරණය අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමට සමාන වන අතර මාණ්ඩලික නිලධාරීන් ලෙස සැලකේ.

**12. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල්**

වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් අයකිරීමේ ප්‍රතිශතය 7%ක් වශයෙන් තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු අතර මේ සඳහා උපලේඛන II හි ඒ ඒ වර්ෂය යටතේ සඳහන් මූලික වැටුප අදාළ කරගත යුතුය.

**13. වැටුප් වර්ධක දිනය**

මෙම වැටුප් සංශෝධනය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

**14. වැටුප් පරිමාණයක උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීම**

වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි නිලධාරීන්ට ඔවුන් විශ්‍රාම යන දින තෙක් හෝ වෙනත් වැටුප් පරිමාණයක් අදාළවන වෙනත් තනතුරට පත්වන / උසස්වන තුරු තවදුරටත් වැටුප් වර්ධකය ලබාදිය හැකිය.

**15. සංයුක්ත දීමනාව**

සංයුක්ත දීමනාව රු. 500 ක් වේ.

**16. ණය / අත්තිකාරම් ලබා දීමේ දී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව**

ණය අත්තිකාරම් ලබා ගැනීමේ දී සලකා බලනු ලබන 40% සීමාව ගණනය කිරීමේදී උපලේඛන II හි සඳහන් එදිනට අදාළ මූලික වැටුප හා ගැලපීමේ දීමනාවද අදාළ කරගත යුතුය.

**17. පොදු උපදෙස්**

මෙම චක්‍රලේඛය අනුව 2016.01.01 දිනට හිමි විය යුතු වැටුප තීරණය කිරීමේදී 2006.01.01 දින හෝ එදිනට පසුව සිදු කළ වැටුප් සංශෝධන අනුව වැටුප් සැකසීම සහ අදාළ වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කර ඇති බවට අදාළ බලධරයන් තහවුරු කර ගත යුතුය.

**18. වැඩිපුර ගෙවීම්**

මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේදී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් නිලධරයෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම්, එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධරයා බැඳී සිටී.

**19.** **පැහැදිලි කර ගැනීම් හා වැඩිදුර උපදෙස්**

මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම් හා වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම්, එවැනි ඉල්ලීම්, භාණ්ඩාගාරයේ ලේකම්, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01 වෙත යොමු කළ යුතුය.

*7.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ නියෝග,— 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වගන්තියේ (2) උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ජූනි මස 15 දිනැති අංක 1971/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*9.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

10.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

11.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

12.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**